ඔන්න එකෝමත් එක රටක
රජ වාසලෙ හිටියා
අන්දරේ කියලා කවටයෙක්.
රජ වාසල කවටයා හැටියට
අන්දරේගෙ රාජකාරිය තමයි
හිනා යන කතන්දර කියලා
හිනා යන වැඩ කරලා
රජතුමා හිනස්සන එක.
අන්දරේ ඉළ ඇට ඇදෙන කල්
කෙළි කවටකම් කරන හින්දා
රජ්ජුරුවො අන්දරේට හරි ආදරෙයි.

(c) Sumitha Publishers


(c) Sumitha Publishers

ඒ කාලෙ මිනිසුන් වැඩි දෙනා ජීවත් වුණේ
ගොවිතැන් බත් කරලා.
මඩ ඉඩම්වල වී වැපිරුවා.
ගොඩ ඉඩම්වල එළවළු වැවුවා.
එළවළුත් එක්ක බත් කාලා
ගොවියෝ නිරෝගිව සතුටින් ජීවත් වුණා.

(c) Sumitha Publishers


(c) Sumitha Publishers